# ජුලී ජේ. චංග් තානාපතිතුමිය
# තරුණ ශ්‍රී ලාංකික ව්‍යවසායක මණ්ඩලයේ
# 24 වැනි සංවත්සරය අමතා පලකළ අදහස්
# 2023 මාර්තු 10
# ෂැන්ග්‍රිලා බෝල් රූම්

වනක්කම්, අස්සලාම් අලෛකුම්, ආයුබෝවන්, සහ සුභ සන්ධ්‍යාවක් වේවා.

තරුණ ශ්‍රී ලාංකික ව්‍යවසායක මණ්ඩලයේ (COYLE) මෙතෙක් සභාපතිත්වය දැරූ දිමුත් වන්මක සිල්වා මහතානෙනි, නව සභාපති රසිත් වික්‍රමසිංහ මහතානෙනි, ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතානෙනි, අමාත්‍යවරුනි, සම්භාවනීය අමුත්තනි, මිත්‍රවරුනි.

සුභ සන්ධ්‍යාවක් වේවා, මේ අවස්ථාවට සම්බන්ධවීම සඳහා කළ ආරාධනයට ස්තුතියි. සම්බන්ධතා ගොඩනංවමින්, ශ්‍රී ලංකාව මුළුල්ලේ ව්‍යාපාර සංවර්ධනයේ නිරත වූ 24 වර්ෂයක් සමරන මේ අවස්ථාවේ COYLE සමගින් එක්වන්නට ලැබීම ගැන මා සතුටු වනවා. ශ්‍රී ලංකාවේ 75 වැනි නිදහස් සංවත්සරය සමරන, එමෙන්ම, ජනතාව, ප්‍රගතිය සහ හවුල්කාරීත්වය යන තේමා කෙරෙහි අවධානය කේන්ද්‍ර කරමින් එක්සත් ජනපදය සමගින් ද්වි පාර්ශවීය සබඳතා ඇතිකරගෙන 75 වසරක් සමරන මේ 2023 වර්ෂය සුවිශේෂී වර්ෂයක් වනවා.

වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා, ඉන් වඩාත් ඔරොත්තුදෙනසුළු හා ශක්තිමත් රටක් ලෙස නැගීසිටීමට, ඔබ සැම වෙහෙස වන මේ අවස්ථාවේ ඔබේ රට සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා. කල්පවත්නා සෞඛ්‍යසම්පන්නබවක් සහිත ආර්ථිකයක් ගොඩනංවාගැනීමට ව්‍යවසායකත්වය නිරූපණය කරන වැදගත් භූමිකාව ගැන මට වඩා හොඳින් ඔබ දැනුවත්.

ණය තිරසාරත්වය යථා තත්වයට පත්කිරීමටත්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවත ගොඩනංවාගැනීමේදී උපකාරී වනු ඇති එම IMF පැකේජය ලබා ගැනීමටත් ශක්තිමත් සහ විශ්වසනීය ණය සහතිකකිරීම් ලබාදීම සඳහා අප සමගින්, එනම් පැරිස් ක්ලබ් සාමාජිකයින්, ඉන්දියාව සහ අනෙකුත් රටවල් සමගින් එකතුවීමට චීනය තීරණය කර තිබීම පිළිබඳ  ප්‍රවෘත්තිය ඔබ සැම මෙන්ම මා ද සාදරයෙන් පිළිගත්තා. අපට අවශ්‍ය කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්වය නිසි පිළිවෙලකට ගැනීම වන බැවින් මෙය හොඳ පියවරක් වනවා. නමුත් එය, ඉදිරියට කරන්නට ඇති අභියෝගාත්ම වැඩ කටයුතු අතරින් පළමු පියවර පමණයි. මීළඟට සැබැවින්ම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සඳහා සම්මුති සාකච්ඡා කිරීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමටත්, කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමටත්, දූෂණයට එරෙහිව සටන් කිරීමටත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඊට ඇතුළත් වනවා. ඉතාමත් භාරදූර කර්තව්‍යයක් වන මෙය එක රැයකින් කරන්නට හැකි දෙයක් නොවේ. එනමුත් ඒ වැඩකටයුතු  ඉටුකිරීම ඔබ වැනි

ව්‍යවසායකයින්ට පූර්ණ වශයෙන් ක්‍රියාකාරී වෙමින් කල්පවත්නා සෞභාග්‍යයක් උදාකරගැනීම සඳහා ඔබේ දායකත්වය ලබාදිය හැකි ආර්ථික පරිසරයක් පෝෂණය කිරීමට මහෝපකාරී වනවා.

පසුගිය මාසයේ ඔබේ ආරාධනයෙන් මෙහි පැමිණි අලි සබ්රි විදේශ අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් කරගැනීම සඳහා සහයදීමට ගෝලීය ප්‍රජාව අතරේ ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම කොතෙක්දැයි අවධාරණය කළා. කවදත් එසේ කළ එක්සත් ජනපදය ඉදිරියටත් ඒ සහයෝගය ලබාදෙනවා: පොහොර, බීජ, පාසල් සඳහා දිවා ආහාර, සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය කරණය යනාදිය සඳහා පසුගිය ජූනි මාසයේ සිට මෙතෙක් ඩොලර් මිලියන 270 ඉක්මවන ප්‍රමාණයක් ලබාදීම; එහි විශාලතම කොටස් හිමිකරු වශයෙන් IMF ක්‍රියාදායමය තුළ ඔබට සහය දැක්වීම; සහ මෙරට නීති ව්‍යුහ, වගවීමේ ක්‍රියාදාමයන්, සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතීන් ශක්තිමත් කිරීමට තාක්ෂණික සහය ලබාදීම ඊට ඇතුළත් වනවා. ඔබේ විශාලතම අපනයන වෙළඳපල වශයෙන් ද අප ඔබේ ආර්ථික වෘද්ධි කාරකවල කොටසක් වන්නට කැමතියි. බදුගෙවන ජනතාව මත පැටවී ඇති බර අඩුකරගැනීමට රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීමටත්, වඩාත් සාධාරණ වන සේ බදු ප්‍රතිසංස්කරණය කිරීමටත් ප්‍රමුඛතාවය දෙන මෙන් COYLE ප්‍රසිද්ධියේ රජය දිරිගන්වා ඇති බව මා දන්නවා- මා එය ප්‍රශංසා කරනවා. දිගින් දිගටම ඔබේ හඬ අවදි කරන මෙන් මා කියනවා.

COYLE සාමාජිකයින් වශයෙන් ඔබ හැමදෙනාට ඉතාමත් වැදගත් භූමිකාවක් පැවරී ඇති බවත්, වෙනසක් ඉල්ලා සිටීම සඳහා ඉතා වැදගත් වේදිකාවක් ලැබී ඇති බවත් ඔබ හැමදෙනා හොඳින් තේරුම් ගෙන ඇතැයි මා සිතනවා. නුදුරු සහ මධ්‍යකාලීන අනාගතයේ ආර්ථිකය වර්ධනය කරගැනීමට ඔබට උදවු කළ හැකිවාක් පමණක් නොවේ, දීර්ඝ කාලීන ආර්ථික යහපැවැත්ම සඳහා මගපාදන පද්ධතිගත වෙනස්කම් වෙනුවෙන් හඬ නගන්නටත් ඔබට හැකියි. ඔබේ ආර්ථිකය සැබැවින්ම තරඟයට සහ වර්ධනයට යොමුකරවා ගැනීම සඳහා, දශක ගණනක් මුළුල්ලේ තිබූ ආරක්ෂණවාදී නැඹුරුතාවලින් දුරස් වන්නට ඔබට පුළුවනි. වසර ගණනක් තිස්සේ ශ්‍රී ලංකාව ලෝක බැංකුවේ ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ සමීක්ෂණය වැනි ශ්‍රේණිගතකිරීම්වල ක්‍රමයෙන් පහළ බැස තිබෙනවා. වඩාත් විනිවිදභාවයෙන් යුත්, කාර්යක්ෂම හා තරඟකාරී වාණිජ පරිසරයක් සඳහා අවශ්‍ය කරන නීතිමය සහ නියාමනමය යහ පරිචයන් වෙනුවෙන් පෙනී සිටීම හරහා මේ නැඹුරුව නිවැරදි කිරීමට ඔබට හැකියාව තිබෙනවා.

නවෝත්පාදනය සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කුසලතා සඳහා COYLE වේදිකාවක් කරගත හැකියි. ව්‍යවසායකයින් වශයෙන් ඔබ රැකියා නිර්මාණය කරනවා, එනිසා ඔබට සර්වග්‍රාහී නොහොත් සියළුදෙනා ඇතුළත් කරගන්නා ආකාරයේ ආයතනික සංස්කෘතියක් ගොඩනගන්නට පුළුවනි. ඔබ එදිනෙදා කරන වැඩ කටයුතු හරහා, ඔබේ සමාගම් සිදුකරන පුණ්‍යාධාර ක්‍රියාකාරකම් හරහා, නැගී එන ඉදිරි ව්‍යාපාර නායකයින් පරම්පරාව සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදීම හරහා, සහ සියළුදෙනාටම සාධාරණ ලෙස ක්‍රියාත්මක වන, විනිවිදභාවයෙන් යුත් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා ඔබේ ඇති කැපවීම හරහා ඔබට සැබෑ වෙනසක් ඇතිකළ හැකියි.

ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මේ සතියේ මා මෙහි පුරුෂයින්ගෙන් පමණක් සැදුම්ලත් මේ ප්‍රේක්ෂක පිරිස ඇමතීමෙහි ඇති උත්ප්‍රාසය මට නොදැනෙනවා නොවේ. මා ඔබේ වෙබ් අඩවිය බැලුවා- එය සම්පූර්ණයෙන්ම පිරී ඇත්තේ ශ්‍රී ලංකාවේ සමාගම් සිය ගණනක් නියෝජනය කරන, සුදු ඇඳුමින් සැරසුනු පිරිමින් විශාල සංඛ්‍යාවකින්. "පාලක බලතල සහිත කොටස් හිමිකරුවන් සහ සභාපතිවරුන් 120 දෙනෙක් එක්ව උද්දේශනයේ නිරතවන" බව ඔබේ වෙබ් අඩවියේ සඳහන් කර තිබෙනවා. එමෙන්ම, ඩෙල්, මයික්‍රොසොෆ්ට්, ඇපල්, සෙරොක්ස් වැනි ඇමරිකානු සමාගම් ගණනාවක් ද ඇතුළුව ඉහළ පෙළේ සන්නාම ගණනාවක් නියෝජනය වනවා. "ජාතික වැදගත්කමකින් යුතු කරුණු සඳහා අත්‍යාවශ්‍ය භූමිකාවක් නිරූපණය කරන තරුණ ශ්‍රී ලාංකික ව්‍යාපාර නායකයින්ගෙන් සැදුම්ලත්, ඉතා බලගතු සහ දක්ෂතා සම්පන්න ව්‍යාපාර මණ්ඩලය" බවට පත්වීමට ඔබ වැයම් දරන බව ඔබේ දැක්මෙහි සඳහන් වනවා. දැන් මා ඔබෙන් අසන ප්‍රශ්නය නම්, කාන්තාවන් නැතිව ඔබ මෙය කරන්නේ කොහොමද? යන්නයි. සිංහල, දෙමළ, සහ මුස්ලිම් යන පූර්ණ විවිධත්වයෙන් යුත් ව්‍යාපාරික කුසලතා නොමැතිව මෙය කරන්නේ කොහොමද? ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ වැයම්වල නිරත වන්නට ගන්නා විට වැදගත් පියවරක් වන්නේ කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම  වඩාත් පුළුල් කිරීමත් ලාභ ඉපයීම සඳහා ඔවුන්ට ඇති කුසලතා සහ දක්ෂතාවලින් ඵල නෙලා ගැනීමයි. මා සඳහන් කළ ආකාරයට දැනට වසර 75කට පෙර ශ්‍රී ලංකාව නිදහස ලැබීමත් එක්සත් ජනපදය සමගින් දීර්ඝ හා වැදගත් හවුල්කාරීත්වයක් ආරම්භ කිරීමත් සිදු වූවා. කාන්තාවන් ඉහළ අධ්‍යාපන මට්ටම් ළඟා කරගෙන ඇතත් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙහි කාන්තා නියෝජනය ඇත්තේ තුනෙන් එකක් පමණයි. විවෘතව කියන්නේ නම්, ශ්‍රී ලංකාව මේ තත්වය වැඩිදියුණු කරගත යුතුයි. සත්‍ය නම්, ශ්‍රම බලකායෙහි ස්ත්‍රීපුරුෂ සමාජභාව පරතරය වැඩි වන විට එහි අවාසිය දැනෙන්නේ කාන්තාවන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවන්ට පමණක් නොවේ, එය සමස්ථ ආර්ථිකයටම පොදුවේ බලපානවා, එය ඔබේ සමාගම්වලටත් බලපානවා. සියළුම තනතුරු සඳහා කාන්තාවන් බඳවාගැනීමට සමාගම් අසමත් වනවිට සිදුවන්නේ ඔබට ලබාගත හැකි හොඳම සහ දක්ෂතම සේවක පිරිසක් ඔබට අහිමිවී යෑමයි. මේ සඳහා ඔබ මගේ වචනය පිළිගතයුතු නැහැ; දූර්වල ආර්ථික වර්ධනය සහ ශ්‍රමබලකායේ පුළුල් ස්ත්‍රීපුරුෂ සමාජභාව පරතරයක් තිබීම අතරේ සහසම්බන්ධයක් පවතින බව බොහෝ අධ්‍යනවලින් පෙන්නුම් කර තිබෙනවා. වඩාත් පුළුල්ව ගතහොත්, ශ්‍රී ලංකා ආර්ථිකයේ විභවය ඉන් සීමා කෙරෙනවා. කෙසේනමුත් කර්මාන්ත රැසක විවිධ ව්‍යාපාරවලට කාන්තාවන් සක්‍රියව සහභාගිවීමත් සමගින් ඔවුන් ලැබූ අගනා ජයග්‍රහණ ද රැසක් අප දැක තිබෙනවා. ඔබ කරන වැදගත් කාර්යභාරය සඳහා සම්බන්ධවීමට කාන්තා ව්‍යවසායකයින්ට ආරාධනා කිරීම හරහා සර්වග්‍රාහීත්වය සම්බන්ධයෙන් ප්‍රමිතීන් ගොඩනගන ආයතනයක් බවට පත්වන්නට මා COYLE දිරිගන්වනවා. ඔබලාගේ කාන්තා අංශය යළි පනගැන්වූ බව මා දන්නවා; නමුත් අපි සාමාජිකයින්ගේ බිරින්දෑවරුන් වශයෙන් පුණ්‍යාධාර කටයුතු යනාදියෙහි නිරතවීමෙන් ඔබ්බට එය ගෙන යමු. එයත් මාහැඟි කටයුත්තක් වන නමුත් වෘත්තීමය ජාලයක් නිර්මාණය කරන පූර්ණ සාමාජිකත්වය සහිත පිරිසක්

ඇති කළ හැකියි. කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වය වැඩි දියුණු කිරීම තුළ ශ්‍රී ලංකාවට තම දළ ජාතික නිෂ්පාදිතය සැලකිය යුතු තරමකින් වර්ධනය කරගත හැකි බව අපි අමතක නොකරමු. කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගීත්වය සියයට 10කින් වැඩි කිරීම තුළ සියළුදෙනාගේ මූර්ත වැටුප සියයට 5කින් වැඩි වන බව එක් අධ්‍යනයකින් සොයාගෙන තිබෙනවා. ශ්‍රම බලකායේ ස්ත්‍රීපුරුෂ සමාජභාව පරතරය අඩුකිරීම සමගින් සමස්ථ ලෝකයේම දළ දේශීය නිෂ්පාදිතය සැලකියයුතු ලෙස වර්ධනය වේවි. මෙය යම් න්‍යායක් හෝ බලාපොරොත්තුවක් හෝ අපේ සිත සතුටු කරගැනීමට කියන දෙයක් නොවේ. එය සැබෑ දත්ත සහ ඉපයූ ලාභ පදනම් කරගත්තක්. නායකත්ව තනතුරුවල වැඩියෙන් කාන්තාවන් සිටින එක්සත් ජනපද සමාගම්වල ලාභදායීත්වය ගැන තවත් දත්ත දෙකක් මා ලබාදෙන්නම්: පෙපර්ඩීන් විශ්වවිද්‍යාලයෙන් සිදුකළ අධ්‍යනයකින් සොයාගෙන ඇති අන්දමට, කාන්තාවන් නායකත්ව තනතුරු සඳහා උසස් කිරීම අතින් හොඳම සමගම් වශයෙන් වාර්තාගත Fortune 500 වර්ගයේ සමාගම් 25ක්, ඔවුන්ගේ අදාළ කර්මාන්තයේ සිටින මධ්‍යනාය සමාගම්වලට වඩා සියයට 18ත් 69ත් අතර වැඩි ලාභදායීත්වයක් සහිත බව සොයාගෙන තිබෙනවා. දෙවැනුව, කාන්තා නායකත්වය සහිත Fortune 500 සමාගම් 13ක කොටස්, S&P 500 සමාගම් (පුරුෂයින් විසින් ප්‍රධාන වශයෙන් නායකත්වය ලබාදෙන සමාගම්) වලට වඩා 25%ක වැඩි කාර්යසාධනයක් පෙන්නුම් කර තිබෙනවා. ආර්ථික අවස්ථා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය වැඩි කිරීම හරහා එක්සත් ජනපදය මෙවැනි සැබෑ ප්‍රතිලාභ නෙලාගෙන  තිබෙනවා. කාන්තාවන් කරා විහිදුම්කරණය, ඔවුන්ට මගපෙන්වීම, සහ අනාගතයේදී COYLE හි පූර්ණ සාමාජිකත්වය සහ එහි නායකත්ව තනතුරු පවා කරා ප්‍රවේශය ලබාදීම ඇතුළුව, කාන්තා ව්‍යවසායකයින් සඳහා ඇති අවස්ථා පුළුල් කරන්නට කැපවන මෙන් කාන්තා ඉතිහාස මාසයේ මේ සැන්දෑවේ මා ඔබට ආරාධනා කරනවා.

පසුගිය 24 වසරක් මුළුල්ලේ ඔබ සංවිධානය අතිමහත් සාර්ථකත්වයක් ලබාගෙන තිබෙනවා, අනාගතය දෙසට නෙත් යොමන ඔබට, සියළුදෙනා ඇතුළත් කරගන්නා, ඉදිරිය දෙසට යොමු වූ ප්‍රවේශයක් තිබීම බොහෝ ප්‍රයෝජනවත් වේවි. මා ඔබට සුභ පතන අතර, වඩාත් සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමෙහි නිරතවන ඔබසැමගේ වැයම් අඛණ්ඩව සාර්ථක වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ශ්‍රී ලංකාවේ සිටින පුරුෂයින්ගේ මෙන්ම කාන්තාවන්ගේ ද, විවිධ ජනවර්ග, ආගම්, සහ ආර්ථික පසුබිම්වලින් එන පුද්ගලයින්ගේ ද නිර්මාණශීලීත්වය, දක්ෂතාවය සහ විවිධත්වය ඔබට අවශ්‍ය වනවා. මෙතෙක් කරගෙන ආ ආකාරයෙන් ම වැඩ කරගන්නට ඔබට හැකියි. නැතිනම්, සම්මතයන් අභියෝගයට ලක් කරන්නට, තරඟ කරන්නට සහ නවෝත්පාදනය කරන්නට  ඔබට හැකියි. අළුතින් පත්වූ සභාපතිතුමා අද සඳහන් කළේ COYLE නායකයින්ගේ දෙවැනි, තුන්වැනි සහ හතරවැනි පරම්පරා මේ වැදගත් කාර්යභාරයන් ඉදිරියට ගෙන යනු දකින්නට කැමති බවයි. එහිදී ඔහු සඳහන් කළේ පුතුන් සහ සහ මුනුබුරන් පිළිබඳව පමණක් නොව දියණියන් සහ මිනිබිරියන් ද පිළිබඳව යැයි කියා මා සිතනවා. මේ වසරේ තේමාව "පරිණාමය: ප්‍රත්‍යස්ථබව, සුවලාභබව සහ පරිවර්තනය" බව දැකීම මට සතුටක්. පරිණාමය

කියන්නේ වෙනස්වීමයි. අපට වෙනස්වීමට ප්‍රතිරෝධය දැක්විය හැකියි, නැතහොත් ඔබට එය පිළිගත හැකියි. " තරුණ ශ්‍රී ලාංකික ව්‍යාපාර නායකයින්ගෙන් සැදුම්ලත්, ඉතා බලගතු සහ දක්ෂතා සම්පන්න ව්‍යාපාර මණ්ඩලය"බවට ඔබට සැබැවින්ම පත්විය හැකියි. එක්සත් ජනපදය දිගින් දිගටම ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ අචල මිතුරකු ලෙස සිටිනවා. ඔබේ රටේ යහපත තකා සහ අපගේ ද්වි පාර්ශවීය සබඳතා සඳහා දායකවීමට ඔබ කරන සැමදෙයක්ම වෙනුවෙන් ස්තුතියි.